# මාධ්‍ය නිවේදනය

## අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය - 2023(2024)

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) - 2023(2024) විභාගයට පෙනී සිටීම සඳහා වන අයදුම් පත්‍ර කැඳවීම 2024 ජනවාරි 23 දින සිට පෙබරවාරි 15 දින දක්වා මාර්ගගත ක්‍රමය ඔස්සේ පමණක් සිදු කරන බව මෙයින් නිවේදනය කරමි.

2. ඒ අනුව සියලු ම පාසල් අයදුම්කරුවන් තම පාසලේ විදුහල්පති මගින් ද, පෞද්ගලික අයදුම්කරුවන් පෞද්ගලිකවම ද අදාල උපදෙස් අනුව මාර්ගගතව අයදුම්පත්‍ර ඉදිරිපත් කළ යුතුය. **පෞද්ගලික අයදුම්කරුවන් ලෙස විභාගය ඉල්ලුම් කළ හැක්කේ රජයේ හෝ රජයේ අනුමත පෞද්ගලික පාසලකින් ශිෂ්‍ය කාර්ය දර්ශනය (අස්වීමේ සහතිකය / අධ්‍යාපන බී 59) ලබා ඇති අයදුම්කරුවන්ට පමණි.**

3. **මෙම වර්ෂයේ සිට සියලු ම පෞද්ගලික අයදුම්කරුවන් අ.පො.ස.(සා.පෙළ) විභාගය සඳහා අයදුම් කිරීමේදී ජාතික හැඳුනුම්පත අනිවාර්ය වේ.** ජාතික හැඳුනුම්පත නොමැති වයස අවුරුදු 15ට වඩා අඩු පෞද්ගලික අයදුම්කරුවකු අ.පො.ස.(සා.පෙළ) විභාගය සඳහා පෙනී සිටීමට බලාපොරොත්තු වන්නේ නම් ඔවුන් විභාගය අයදුම් කිරීම සඳහා විභාග දෙපාර්තමේන්තුව වෙත පැමිණීම අනිවාර්ය වේ.

4. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය වන www.doenets.lk හෝ www.onlineexams.gov.lk/eic වෙත පිවිස අදාල උපදෙස් හොඳින් කියවා ඒ අනුව ම නිවැරදිව අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ය. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගෙන අවශ්‍ය අවස්ථාවකදී ඉදිරිපත් කිරීමට තමන් භාරයේ සුරක්ෂිතව තබා ගත යුතුය. පාසල් අයදුම්කරුවන් ඉදිරිපත් කිරීම සඳහා භාවිත කළයුතු පරිශීලක නාම (user name) හා මුර පද (password) පාසල් ප්‍රධානීන් වෙත ලබා දී ඇත.

**2024 පෙබරවාරි මස 15 වන දින මධ්‍යම රාත්‍රී 12.00 පැයෙන් පසුව මෙම විභාගය සඳහා අයදුම් කළ නොහැක. එදින මධ්‍යම රාත්‍රී 12.00 පැයෙන් පසුව මාර්ගගත ප්‍රවේශය වසා තබනු ලැබේ. කිසිඳු හේතුවක් මත හෝ අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය දීර්ඝ කිරීමක් සිදු නොකරන බව ද අවධාරණය කරමි.**

5. මේ සම්බන්ධයෙන් කිසියම් විමසීමක් අවශ්‍ය වන්නේ නම් පහත දැක්වෙන දුරකථන අංක මගින් හෝ විද්‍යුත් තැපෑල මගින් විමසීම් කළ හැකිය.

දුරකථන අංක : 0112784208 / 0112784537 / 0112785922

විද්‍යුත් තැපෑල : gceolexamsl@gmail.com

එච්.ජේ.එම්.සී. අමිත් ජයසුන්දර
විභාග කොමසාරිස් ජනරාල්

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
පැලවත්ත, බත්තරමුල්ල.

H:U. A\6.3\Media Notice 2023 OL.docx